# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/10 - 2016 නොවැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2016.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත**

3 (2) වගන්තිය යටතේ වන නිවේදනය

2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 3(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, ඉඩම් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව, මෙම නියමය මගින් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ කොන්දේසි යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගනු ලැබූ, කොළඹ 03 ආර්. ඒ. ද. මෙල් මාවතේ අංක 418, 420 සහ 422 හි මහල් නිවාස සංකීර්ණයක් ඇතුළුව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වන, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ නිරත ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ් වෙත පවරනු ලැබ ඇති, ගාමිණි බී. දොඩම්වෙල අවසරලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 4839 හා 2004 ජූලි 03, දිනැති පිඹුරේ සඳහන් ලොට් ඒ දරන කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවතේ, වරිපනම් අංක 418 දරන ස්ථානයේ පිහිටි ඉඩම 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

11 - 1054

1A - PG 3222 — 532 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*